## 393 අම්මා පුදන්නයි

අම්මා පුදන්නයි දරු අප එන්නේ

ලස්සන තුරු ලිය පවනෙ ලෙලෙන්නේ
සැම දෙන කුසුමින් හිනැහී බලන්නේ
දරු කැළ මල් ගෙන මව වෙතැ එන්නේ
අම්ම පුදන්නයි දරු අප එන්නේ //

මද නල දස අත ගත පිනවන්නේ
අම්මගේ ආදරේ අපට කියන්නේ
දරු කැළ බැතියෙන් හද ඔසවන්නේ
අම්මා පුදන්නයි දරු අප එන්නේ //

සුසුදු නිමල මව් සරණෙ පතන්නේ
ඔබ දරු දැරියන් රකින්නැ පෙම්නේ
දින දින දෙව් පෙම වඩමින් සොඳිනේ
අම්මා පුදන්නයි දරු අප එන්නේ //

සුර මව් ආදර මව්නී
දරු කැළ වෙනුවෙන් යදින්න රැජිණී
ඔබ පුතු දින දුක් සගපුර පැමිණී
දෙව්ඳු දකින්නයි දරු අප එන්නේ //